සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Covid-19 සති පාසල් වැඩසටහන

පෙරදිග සංගීතය - 12 තෙවන වාරය

2020/06/08 සිට 2020/06/12

කාර්ය පත්‍රිකා අංක 09

නිපුණතාව - 5.0 නිපුණතා මට්ටම - 5.1

පාඩම - අනාසාතාත්මක මෙහෙ ගී ( පතල්,බඹර,ටීකා සීපද )

මෙහෙ ගී - නෙළුම් ගී ( ඔසේ ගායනා ) වරම් ගී

පළමු කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරන්න.

1. මෙහෙ ගී යටතට ගැනෙන ගීත වර්ගයක් නොවන්නේ,

   1.නෙළුම් ගී 2.වරම් ගී 3.පතල් ගී 4.දරු නැළවිලි ගී 5.බඹර ගී

2. මෙහෙ ගී වල දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ,

   1.ස්වර පරාසය පටු වීම 2.ඉහළ හඬකින් ගායනය

   3.සෑම ගීතයක්ම ඒකලව ගායනය 4.පද මාලාව සරල වීම.

   5.නාද මාලාව සරල වීම

3. සමූහව ගැයෙන ගීත වර්ගයක් වන්නේ ,

   1.නෙළුම් ගී 2.ටීකා සීපද 3.පැල් ගී 4.පතල් ගී 5.බඹර ගී

4. අනාසාතාත්මක මෙහෙ ගී ඇතුළත් නොවන පිළිතුර වන්නේ,

   1.පතල් ගී - බඹර ගී 2.බඹර ගී - ටීකා සීපද 3.පතල් ගී - වරම් ගී

   4.පාරු ගී - පැල් ගී 5. ගැල් ගී - පැල් ගී

5. ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුළත් මෙහෙ ගී විශේෂය වන්නේ,

   1.නෙළුම් ගී 2.වරම් ගී 3.ටීකා සීපද 4.බඹර ගී 5.පතල් ගී

- නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

  කිසියම් කාර්යයක් හා සම්බන්ධව ගැයුණු ගීත 6.__________ ගී නමින් හඳුන්වයි.. ඔසේ ගායනා ඇතුළත් ගීත විශේෂයක් ලෙස 7.________ ගී දැක්විය හැක . "දේවතා දූවක් ඇවිදින් කියන්නේ" ගීතය 8. _____ ඔසයට අනුව ගැයේ.නෙළුම් ගී 9. __________ ලයකින් ගයයි . බුදුන් හා දෙවියන්ගෙන් අවසර ගැනීමට ගයන ගී 10. _______ ගී වේ.

දෙවන කොටස

- පහත දැක්වෙන්නේ නිර්දේශිත ජන ගී කිහිපයකට අයත් ගී පදයන්ය.

තේමිය ජාතියේ බෝසත් උපන්නේ
කොළඹ සිටන් නා තම්දෙන තානම්
දොළු කන්දේ ගල දෝ අර පෙනෙන්නෙ
ඔඩි හෙලෙයි හෙල වටකර මුළුල්ලා
රත්තරන් පනේ ඹබ එව් පත ලැබුණා
වාරේ වාරේ කියනවා විනා
කළුවන් කළු රුවයි මංගෝ
සබරගමුව එළියයි පෙරහැර දාට
තව තවා බඹරු පිස පිස දමන කොට
අවරු උදය පායන හිරු දෙවිගේ වරම්

1. ඉහත ගී පාද අයත් ගී වර්ග නම් තරන්න.
2. ඉහත ගී වර්ග අතරින් අනාසාතාත්මකව ගැයෙන ගී වර්ග 2 ක් තෝරාගෙන සම විෂමතා දක්වන්න.
3. ඉහත ගී වර්ග අතරින් ආසාතාත්මකව ගැයෙන ගී වර්ග 2 ක් තෝරාගෙන සම විෂමතා දක්වන්න.
4. ඉහත ගී වර්ග අතරින් ආසාතාත්මක හා අනාසාතාත්මක ගී වර්ග 2 ක් තෝරාගෙන සමවිෂමතා දක්වන්න.

සැකසුම -

ර / සුමනා බා.වි.

ර / කුරුවිට ම.ම.වි.

ර / පත්බේරිය නාරද ම.ම.වි.

ර / නවනගර කුමර වි.